# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,478 — 1965 අගෝස්තු 10 වැනි අඟහරුවාදා — 1965.8.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### මිළ පාලන පනත

පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන නියෝග මවිසින් අනුමත කරනු ලැබූ බව (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වැනි වගන්තියේ 7 වැනි උපවගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

1965 අගෝස්තු මස 9 වැනි දින,
කොළඹ දීය.

උපලේඛනය

| නියෝගයේ දිනය | නියෝගය නිකුත්කළ නිලධාරි | නියෝගය අදාල ද්‍රව්‍ය | නියෝගය පලකරන ලද ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 1965.6.30 ... | බදුලු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක ... | සහල් ... ... | 1965.7.7 දින අංක 14,443 |
| එම ... | එම ... | කිරිඟු පිටි ... ... | එම |
| එම ... | එම ... | අතිරේක ආහාර ද්‍රව්‍ය-මසූර් පරිප්පු... | එම |
| එම ... | එම ... | ශුද්ධ නොකළ දුඹුරු සීනි ... | එම |
| 1965.7.17 ... | අම්පාර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක ... | අතිරේක ආහාර ද්‍රව්‍ය ... | 1965.7.22 දින අංක 14,457 |
| එම ... | එම ... | සක්කර ... ... | එම |
| එම ... | එම ... | මසූර් පරිප්පු ... ... | 1965.7.22 දින අංක 14,457 |
| 1965.7.15 ... | බදුලු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක ... | මසූර් පරිප්පු ... ... | 1965.7.24 දින අංක 14,460 |
| 1965.7.23 ... | මාතලේ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක ... | එම ... | 1965.7.29 දින අංක 14,463 |

8–502

---

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් මාලාවේ 171 වැනි පරිච්ඡේදයේ ආහාර පාලන පනත

අංක 236 දරණ නියෝගය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් මාලාවේ 171 වැනි පරිච්ඡේදයේ ආහාර පාලන පනතේ 4 (1) (i) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, කෘෂිකර්ම සහ ආහාර කටයුතු පිළිබඳ ඇමති තැන්පත් මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, ලංකාවේ එක තැනක සිට ලංකාවේ තවත් තැනකට ආහාර පාලක තැන විසින් හෝ ප්‍රථමයෙන් සඳහන් කළ තැන ඇතුළත් ප්‍රදේශයේ නියෝජ්‍ය ආහාර පාලක තැන විසින් හෝ සහකාර ආහාර පාලක තැන විසින් හෝ මේ ඉහත අය වෙනුවෙන් නිකුත් කළ බලපත්‍රයක් පිට හෝ නොහොත් එකී බලපත්‍රයක අන්තර්ගත කොන්දේසි පිට හැර, පාට කළ වී ඇට සහිත වී ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීම හෝ ගෙනයාම තහනම් කරමි.

එහෙත් මෙම නියෝගයේ ඉහත දැක්වෙන තහනම්, පහත සඳහන් ක්‍රියාවන්ට බලපවත්වන්නේ නැත :—

(අ) ලංකා රජය වෙනුවෙන් කිසිවෙකු එවැනි වී කිසියම් ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීම හෝ ගෙන යාම; හෝ

(ආ) ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරණු ලැබූ කිසියම් වී ප්‍රමාණයක්, එසේ ලබාගත් ලියාපදිංචි කරණු ලැබූ වී මෝල් හිමියකු විසින් හෝ එකී වී මෝල් හිමියා වෙනුවෙන් යම්කිසි කෙනෙක් එකී වී මෝල් හිමියාගේ ගබඩාවට හෝ ව්‍යාපාරික ස්ථානයට ප්‍රවාහනය කිරීම හෝ ගෙනයාම.

මෙම නියෝගයෙහි—

'' පාට කළ වී ඇට '' යනුවෙන් දැක්වෙන්නේ '' මැලවයිට් ග්‍රීන් '' යන කොළ පාටින් හෝ ' කොචීන් ස්කාලට් '' යන රතුපාටින් හෝ වෙනත් පාට කරන ද්‍රව්‍යකින් කෘත්‍රිම ලෙස පාට කළ විට කොළ හෝ රත් පාටක් නැඟුණු වී ය.

'' ලියාපදිංචි කරන ලද වී මෝල් හිමියෙක් '' යනුවෙන් දැක්වෙනුයේ ගාස්තුවක් පිට හෝ ඒ වෙනුවට දෙන දීමනා පිට වී කෙටීම සඳහා ගොවිජන සේවා කොමසාරිස් තැන යථා කාලයට ලියාපදිංචි කළ කෙනෙකි.

1965 අගෝස්තු මස 9 දින,
කොළඹ දීය.
8–503

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම සහ ආහාර කටයුතු පිළිබඳ ඇමති.

---


ලංකාවේ වැලව්වේතයෙහි පිහිටි '' ඊස් ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් '' හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

1205—ආර් 8055—7,100 (65/8)